**ලංකාවේ සීමා සහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් භාවිතා කරනු ලබන මෝටර් වාහන, යන්ත්‍ර, පරිගණක සහ විදුලි සවිකිරීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 හි 30 වගන්තිය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගනු ලැබූ පරිගණකවල මුළු වාරික වටිනාකම වූ රු. 4,167,848 ක් ගෙවා නිම කර තිබූ නමුත් එය සින්නක්කර වත්කම්වලට මාරු කර නොතිබුණි.

(ආ) විදේශ ණයගැතියන් දැන්වීම් පළ කිරීම සඳහා කරන ලද තැන්පත්වලින් එකතුව රු. 1,522,392 ක ශේෂ වගකීම් යටතේ අත්තිකාරම් ලෙස පෙන්වනවා වෙනුවට වෙළඳ ණය ගැතියන්ට එරෙහිව හිලව් කර තිබුණි.

(ඇ) මුද්‍රණ වැඩ සඳහා සමාගමේ වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා යුද හමුදාව විසින් ගෙවන ලද රු. 1,331,868 ක අත්තිකාරම් මුදල වගකීම් යටතේ ගෙවිය යුතු අත්තිකාරමක් ලෙස පෙන්වනවා වෙනුවට ණය ගැතියන් යටතේ බැර ශේෂයක් ලෙස පෙන්වා තිබුණි.

(ඇ) වෙළඳ දැන්වීම් ණයගැතියන් තුල අන්තර්ගතව තිබූ එකතුව රු. 19,863,773 ක බැර ශේෂ, වගකීම් යටතේ පෙන්වනවා වෙනුවට එම ගිණුමේ හර ශේෂයට එරෙහිව හිලව් කර තිබුණි.

(ඉ) විස්තරාත්මක ආදායම් වියදම් ගිණුමේ පෙන්වා ඇති වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ බාහිර වැඩවල පිරිවැය ගණනය කිරීමේදී, ලාභ ආන්තිකයද ඇතුළත් අභ්‍යන්තර වැඩවල ආදායම, එම දෙපාර්තමේන්තුවේ සමස්ත නිෂ්පාදන පිරිවැයෙන් අඩු කර තිබුණි.

(ඊ) රු. 300,000 ක් වූ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ කරන ලද ආයෝජනය අනුචිත ලෙස ලැයිස්තුගත නොවන සමාගම් ආයෝජන යටතේ වර්ග කර තිබුණි.

(උ) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 2008 වර්ෂයේදී එකක් රු. 1,000 බැගින් වූ කොටස් 2,400 ක් මිලදී ගැනීම සඳහා ලංකා පුවත් සමාගමට රු. මිලියන 1.2 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. එකී මුදල මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන යටතේ පෙන්වනු වෙනුවට අත්තිකාරමක් ලෙස පෙන්වා තිබුණි.

(ඌ) 1999 වර්ෂයට අදාල රු. 8,652,936 ක් වූ මාර්ගස්ථ භාණ්ඩ වටිනාකම, අවශ්‍ය ගැලපීම් සිදු කිරීමෙන් තොරව දිගින් දිගටම විවිධ ණයගැතියන් යටතේ පෙන්වා තිබුණි.

(එ) "ගොස් මැග්නම් ෆෝ එක්ස්පැන්" යන්ත්‍රයට 2011 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ රු. 2,364,780 ක මුදල ගිණුම්ගත කර නොතිබණි. ඒ හේතුවෙන් වත්කම් හා වගකීම් ගිණුම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඒ) සමාගමේ නමට තිබූ ස්ථාවර තැන්පතු 2 ක එකතු වටිනාකම රු. 309,627 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

1.2.3 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව දායක මුදල් ණයගැති ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 15,861,472 ක් විය. විස්තරාත්මක උපලේඛන අනුව එකී ශේෂය රු. 11,110,942 ක් විය. ඒ අනුව වෙනස රු. 4,750,530 ක් වූ අතර එය සසඳා නොතිබුණි.

1.2.4 හඳුනා නොගත් වෙනස්කම්

------------------------------

"ඇඩ්ප්‍රෝ" පද්ධතිය මගින් ගිණුම්ගත කරන ලද දෛනික ලැබීම් සහ බැංකුවේ තැන්පත් කරන ලද මුදල් අතර රු. 85,020 ක අතිරික්තයක් හා රු. 137,854 ක ඌනතාවක් නිරීක්ෂණය විය. එම වටිනාකම් 2011 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව පිළිවෙලින් හිඟ බැර හා හර ලෙස පෙන්වා තිබුණි.

1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා ගෙවූ එකතුව රු. 2,105,423 ක් වූ අත්තිකාරම්, වර්ෂ 01 සිට 7 දක්වා කාල පරාසයක් තුල හිඟව පැවතුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට පුවත්පත් නියෝජිත ණයගැතියන් තුල ඇතුලත් අත්හිටවූ ණයගැති මුදල රු. 2,631,559 ක් විය.

(ඇ) පුවත්පත් නියෝජිත ණයගැතියන් තුළ ඇතුළත් ඉවත් කළ ණයගැතියන් වටිනාකම 2011 දෙසැම්බර් 31 දිනට රු. 9,661,338 ක් විය. එකී ණයගැතියන්ගෙන් රු. 5,324,376 ක් හෙවත් 55% ක් ශේෂයක් වර්ෂයකට පෙර ඉවත් කළ ණය ගැතියන්ය. මේ සම්බන්ධයෙන් සමාගම නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තු ණයගැතියන් යටතේ පෙන්වා තිබූ රු. 654,758 ක මුදලක් වර්ෂ 2 ට වඩා හිඟව පැවතුණි. එම මුදල තුල ඇතුළත් චලනය නොවන ශේෂය රු. 135,735 ක් විය.

(ඉ) ශේෂය රු. 50,000 ට වැඩි ණයගැතියන්ට අදාලව එකතුව රු. 515,777,384 ක වූ වෙළඳ ණයගැතියන්ට සනාථ කිරීම් ලිපි යවා තිබුණි. එයින් රු. 20,884,706 ක් වටිනා ණයගැතියන් සම්පූර්ණයෙන් එකඟතාව පල කර තිබුණි. රු. 6,738,388 ක් වටිනා ශේෂ සමඟ එකඟ වී නොතිබුණ අතර 2012 ජුනි 29 දින දක්වා රු. 488,154,290 ක් වටිනා ශේෂ සනාථ කිරීම් ලැබී නොතිබුණි.

(ඊ) වෙළඳ දැන්වීම් සඳහා ණය කාලය දින 50 ක් වුවත් ශුද්ධ වෙළඳ දැන්වීම් ණයගැතියන්ගෙන් 4% ක් වර්ෂ 1 ට වැඩි ණය ශේෂයන් විය. රු. 2,580,486 ක මුදලක් රජයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ ණය ගැතියන් විය. තවද දින 720 කට වැඩි රජයේ හා පෞද්ගලික අංශයේ ණය ගැති ශේෂවල එකතුව රු. 5,421,207 ක් විය.

(උ) විවිධ ණය හිමියන් ශේෂය තුල 2008 වර්ෂයට අදාල රු. 982,363 ක හඳුනා නොගත් තැන්පතුවක් ඇතුළත් වී තිබුණි. එය හඳුනා නොගෙන ගිණුම්වල ගැලපීම් නොකර ණය හිමියන් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඌ) සමාගමකට ණය පදනම මත ප්‍රදානය කරන ලද මුද්‍රණ කඩදාසි සඳහා 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 20,472,394 ක මුදල, වර්ෂ 2 කට වඩා හිඟව පැවතුණි.

(එ) මුද්‍රණ කඩදාසි කිලෝග්‍රෑම් 199,798 ක්, භාණ්ඩ හුවමාරු කර ගැනීමේ පදනම යටතේ 2010 ජනවාරි හා පෙබරවාරි මාසවලදී ලක්බිම සමාගමට ලබාදී තිබුණි. එහෙත් 2011 දෙසැම්බර්

31 දින දක්වා එයින් කිලෝග්‍රෑම් 104,388 ක් පමණක් ආපසු ලැබී තිබුණි. ඒ අනුව රු. 6,821,487 ක් වටිනා මුද්‍රණ කඩදාසි කි.ග්‍රෑ. 95,410 ක් 2012 ජුනි 29 දින වන විටත් ආපසු ලැබී නොතිබුණි.

(ඒ) රු. 18,343,239 ක් වටිනා අගරු චෙක්පත් 130 ක් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. එයින් රු. 1,814,872 ක් වටිනා චෙක්පත් 67 ක් වර්ෂ 1 ට වඩා හිඟව පැවතුණි.

### 1.2.6 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

භෞතික සත්‍යාපන වාර්තා නොමැතිවීම හේතුකොටගෙන රු. 6,374,634 ක් වටිනා මෝටර් වාහන 7 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය.

### 1.2.7 නීති, රීති, සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| (i) 13(8) වගන්තිය | 2010 වර්ෂය සඳහා මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කළ වාර්තාවෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග හා ගෙන ඇති ක්‍රියා මාර්ග සඳහන් කරමින් සමාගම විසින් පිළිතුරක් එවා නොතිබුණි. |
| (ii) 14(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) 13(5)(ඩී) වගන්තිය | අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114(1) වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 ඡේදය | බෝනස් ගෙවීම්වලට අදාල උපයන විට ගෙවීමේ බදු සේවකයින්ගේ වැටුපින් අඩු නොකොට සමාගම විසින් ගෙවා තිබුණි. 2010/2011 වර්ෂය සඳහා එසේ ගෙවූ මුදල රු. 12,481,683 කි. |

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | |
|---|---|
| (i) 9.2 (ආ) සහ (ඇ) වගන්තිය | සංවිධාන සටහනට සහ අනුමත කාර්ය මණ්ඩලයට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු නමුත් එසේ ලබාගෙන නොතිබුණි. |
| (ii) 9.2 (ආ) වගන්තිය | සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය සංයුක්ත සැලැස්මේ ඇතුළත් කළ යුතු නමුත් 2006 ජුල 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 2006 සිට 2015 දක්වා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට ඇතුළත් කර තිබුණි. |

1.2.8 මතභේදයට තුඩු දෙන විෂයයන්

---------------------------------

අදාල ආයතන හෝ පුද්ගලයින්ගෙන් විධිමත්ව ඇණවුම් ලබාගැනීමකින් තොරව, රු. 15,054,600 ක් වටිනා මුද්‍රණ වැඩ 10 ක් වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ කර තිබුණි. තවද එම වැඩ වලින් රු. 6,074,600 ක් වටිනා වැඩ සඳහා ගාස්තු අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. වෙනත් වැඩ විෂයයන් තුනකට අදාල රු. 7,980,000 ක මුදලක් කිසිදු පදනමක් නොමැතිව විකුණුම් ප්‍රවර්ධන ගිණුමට එරෙහිව කපා හැර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 14,036,475 ක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂය සඳහා බදු පූර්ව ශුද්ධ පාඩුව රු. 359,781,998 ක විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 373,818,473 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. වියදම් රු. 228,489,987 කින් අඩුවීම හා ආදායම රු. 145,328,486 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සමාගමේ දල ලාභ ආන්තිකය හා ලාභ අධිකය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී පිළිවෙලින් 1.95% කින් හා 7.63% කින් වැඩි වීමක් විය. ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයෙහි පිරිවැය රු. මිලියන 176 කින් අඩු විය. ඒ හේතුවෙන් ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ පාඩුව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 14 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් බවට පරිවර්තනය විය. මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයේදී අනාවරණය වූ ඇතැම් කරුණු ඉකුත් වර්ෂය හා සසඳා පහත දැක්වේ.

| | 2011 | 2010 |
|---|---|---|
| | % | % |
| දල ලාභ ආන්තිකය | 50.42 | 48.47 |
| ලාභ අධිකය (විකුණුම් පිරිවැය මත දල ලාභය) | 101.69 | 94.06 |
| පිරිවැටුම මත පරිපාලන පිරිවැය | 40.00 | 45.19 |
| පිරිවැටුම මත විකුණුම් හා බෙදා හැරීම් පිරිවැය | 10.14 | 10.95 |
| පිරිවැටුම මත මූල්‍ය පිරිවැය | 3.63 | 2.42 |
| ජංගම අනුපාතය | 1.44:1.00 | 1.46:1.00 |
| ද්‍රවශීල අනුපාතය | 0.95:1.00 | 1.04:1.00 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගම සමාලෝචිත වර්ෂයේදී පුවත්පත් 6 ක්, වාර සඟරා 12 ක් සහ වාර්ෂික ප්‍රකාශන 2 ක් ප්‍රසිද්ධ කළ අතර ඉකුත් වර්ෂයේදී පුවත්පත් 6 ක්, වාර සඟරා 7 ක් සහ වාර්ෂික ප්‍රකාශන 11 ක් ප්‍රසිද්ධ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පුවත්පත්, වාර සඟරා සහ වාර්ෂික ප්‍රකාශනවල ශුද්ධ දායකය රු. 179,311,948 කින් වැඩි වී තිබුණි.

(ආ) සමාගම පළකල පුවත්පත් 6 න්, මූල්‍ය ප්‍රතිඵලවලට වාසිදායක දායකත්වයක් ලබාදී තිබුණි. විස්තර පහත පරිදි වේ.

(i) සමාගමේ සමස්ථ වෙළඳ දැන්වීම් ආදායම, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී රු. 253,503,962 කින් හෙවත් 12.7 කින් වැඩි වූ අතර 2011 ඔක්තෝබර් 01 දින සිට වෙළඳ දැන්වීම් ගාස්තු 31.5% කින් ඉහළ දමා තිබුණි.

(ii) සමාගමේ සමස්ථ පුවත්පත් විකුණුම් ආදායම, පසුගිය වර්ෂයේ රු. 474,808,907 සිට සමාලෝචිත වර්ෂයේදී රු. 496,505,606 ක් දක්වා 4.57% කින් වැඩි වූ අතර සමාලෝචිත වර්ෂයේදී පුවත්පත් 3 ක මිල ගණන් 25% කින් ඉහළ දමා තිබුණි.

(iii) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී වෙළඳ දැන්වීම් ආදායම සහ පුවත්පත් විකුණුම් ආදායම අඩුවීම හේතුවෙන් සිළුමිණ පුවත්පතේ ශුද්ධ දායකය රු. 34,731,985 කින් අඩුවී තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ නිලධාරියෙකුට වියලි ආධාර වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 250,000 ක අත්තිකාරමක් 2004 සැප්තැම්බර් මාසයේදී ලබාදී තිබුණි. කෙසේ වෙතත් එකී නිලධාරියා දැනටත් සේවයේ යෙදී සිටියද මෙම අත්තිකාරම නිරවුල් කර නොතිබුණි.

(ආ) සීමාසහිත ලේක හවුස් දේපල සංවර්ධන සමාගමේ 1985 වර්ෂයේද ආයෝජනය කර තිබූ රු. 7,500,000 සඳහා සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2011 ක්‍රියාකාර සැලැස්මට අනුව, වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන්නේ ආදායම ඉහළ දැමීම වන අතර බාහිර ආදායම 55% ක් ඉපැයීමට හා අභ්‍යන්තර ආදායම 45% ක් ඉපැයීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම තථ්‍ය ආදායම සමඟ සැසඳීමේදී මුළු අයවැය ගත ආදායමින් 71% ක් පමණක් සාක්ෂාත් කරගෙන තිබූ බවත්, අභ්‍යන්තර ආදායමින් 70% ක් හා බාහිර ආදායමින් 30% ක් උපයා තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව සමාගම බාහිර ආදායම් ඉලක්කයන් සපුරාගෙන නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාවිතා කළ නොහැකි මෝටර් වාහන 7 ක් අපහරණය කිරීමට තීරණය කර තිබුණු අතර එයින් වාහන 3 ක් පමණක් අපහරණය කර තිබුණි. ඉතිරි වාහන 4 භාවිතා කළ නොහැකි වත්කම් ලෙස 2011 දෙසැම්බර් 31 දිනට පැවතුණි. මෙම වාහනවල පිරිවැය රු. 3,737,812 ක් විය.

(ආ) භාවිතා කළ නොහැකි රු. 71,991 ක් වටිනා අභ්‍යාස පොත් තොගයක් මහනුවර ශාඛා කාර්යාලයේ පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) කැමරා සහ වෙනත් උපකරණ විෂයයන් 147 ක් අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව ඡායාරූප සේවා දෙපාර්තමේන්තුවේ පැවතුණි. එකී උපකරණවල වටිනාකම විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට රු. 203,421,900 ක් වටිනා පෙළ පොත් 24 ක් මුද්‍රණය කිරීමේදී ඒවා සැපයීම ප්‍රමාද වීම සහ ගුණාත්මක භාවය අඩුවීම හේතුකොටගෙන, සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,070,242 ක දඩ මුදලක් ලෙස ගෙවා තිබුණි. පසුගිය වර්ෂවලද ගෙවා ඇති මෙවැනි දඩ මුදල් ප්‍රමාණය රු. 4,799,532 ක් විය.

(ආ) බෙදාහැරීමේ අංශය විසින් බෙදා හරින ලද පුවත්පත්වලින් විශේෂ හා පොදු හේතු මත ආපසු එවීම්, සමාගම විසින් ආපසු භාරගනු ලැබේ. ඊට අමතරව නියෝජිතවරුන්ට වෙළඳ ප්‍රවර්ධනය සඳහා බෙදාහල අතිරික්ත පුවත්පත් කිසිදු සීමාවකින් තොරව ආපසු භාරගනී. 2011 ජනවාරි සිට මැයි දක්වා වූ පුවත්පත් නියෝජිත විශේෂ ආපසු එවීම් නිවේදන සාරාංශය පිළිබඳව කරන ලද සෝදිසි පරීක්ෂණයකදී ආපසු එවා තිබූ පුවත්පත්වලින් 90% ක්ම වෙළඳ ප්‍රවර්ධන කාර්යය සඳහා වැඩිපුර යැවූ පුවත්පත් බව අනාවරණය විය.

3.6 මුදල් කළමනාකරණය

සමාගම විසින් 2011 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශනයන්හි දැක්වූ ගැලපුම් විග්‍රහයට අනුව, මාස 6 කට වැඩි කාලයක් තුළ ගැලපුම් නොකළ හඳුනා නොගත් හර හා බැර ශේෂයන් පිළිවෙලින් රු. 1,822,226 ක් හා රු. 803,287 ක් විය.

3.7 හඳුනා ගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් එක් පුවත්පතකට හා වාර සඟරාවකට පිළියෙල කරන ලද මුද්‍රණ ඇණවුම්වල ප්‍රමාණය ඉක්මවා සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී පුවත්පත් සහ වාර සඟරා පිටපත් 2,506,449 ක් මුද්‍රණය කර තිබුණි. තවද, ප්‍රකාශන මුද්‍රණයේදී සමාගම විසින් අපතේ යන ප්‍රමාණය සඳහා ඉඩ දී ඇති ප්‍රමාණය හොඳ තත්ත්වයේ පුවත්පත් වලින් 5% ක් විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී හොඳ තත්ත්වයේ පුවත්පත් සහ අපතේ ගිය පුවත්පත්

සැසඳීමේදී, එසේ ඉඩදුන් ප්‍රතිශතය සමහර අවස්ථාවලදී ඉක්මවා ගොස් ඇති බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුලදී පුවත්පත් සහ වාර සඟරාවල හොඳ පිටපත් බෙදාහැරීමෙන් පසු සමාගමේ ඉතිරි වූ පිටපත් ප්‍රමාණය 858,813 ක් විය. මේවාහි පිරිවැය ආසන්න වශයෙන් රු. 18,403,595 ක් විය.

(ආ) ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් අයවිය යුතු ලෙස පෙන්වා තිබූ රු. 5,432,000 ක මුදල සමාලෝචිත වර්ෂය තුලදී වියදමක් ලෙස, කිසිදු පදනමකින් තොරව විකුණුම් ප්‍රවර්ධන ගිණුමට මාරුකර තිබුණි.

3.8 සමාගමේ සම්පත් වෙනත් පාර්ශවයන් විසින් උපයෝජනය කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව සමාගමේ නිලධාරීන් 5 දෙනෙකු බාහිර ආයතනවලට මුදාහැර තිබුණි. ඔවුන්ගේ වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී සමාගම රු. 1,103,112 ක් වැය කර තබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

4.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2010 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සමාගම විසින් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අත්තිකාරම් පියවීම

(ආ) ශාඛාවල මූල්‍ය පාලනය

(ඇ) වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වැඩ ලේඛන පවත්වාගෙන යාම.